අයවැය චක්‍රලේඛ 144

මගේ අංකය :BD/1/8/2/06
ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01
2009 අගෝස්තු මස 04 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් /
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>අයවැය සහකාර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2010</u>**

රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට ඔබේ අවධානය යොමු කරවනු ලැබේ.

02. අයවැය සහකාර නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු 2010 ජනවාරි මස 01 දින සිට බල පැවැත්වෙන සේ ක්‍රියාත්මක කළ යුතු අතර, එහිදී නිලධාරීන්ට මෙන්ම රාජ්‍ය සේවාවට ද ඇතිවන අපහසුතා මගහැරවීම පිණිස පහත සඳහන් ආකාරයට ස්ථාන මාරු පිළිබඳ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සැලකිලිමත් විය යුතුය.

03. ස්ථාන මාරුවීම්වලදී සලකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති

3.1 2009 දෙසැම්බර් 31 දින වනවිට

රජයේ ආයතනයක/ දෙපාර්තමේන්තුවක/ අමාත්‍යාංශයක/ අමාත්‍යාංශයක් යටතේ එකම කාර්යාලයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියළුම නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

3.2 (අ) සේවා කාලය ගණනය කිරීමේදී දෙපාර්තමේන්තුවක්/අමාත්‍යාංශයක් හෝ දිස්ත්‍රික්කයක් තුළ අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ.

(ආ) කිසියම් දෙපාර්තමේන්තුවක්/අමාත්‍යාංශයක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කළ ද එම කාලය එම දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ. දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේ දී එම දිස්ත්‍රික්කය තුළ කුමන කාර්යාලයක සේවය කළ ද දිස්ත්‍රික් සේවා කාලය ලෙස ගණන් ගැනේ.

3.3 යම් ආයතනයක අවුරුදු 05 කට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් වන බැවින්, තමන් අනුයුක්ත වීමට කැමති සේවා ස්ථාන 05 ක් ඇමුණුම 1 ආකෘති පත්‍රයේ නියමිත ස්ථානයේ සඳහන් කළ යුතුය. එසේ සඳහන් කළහොත් එහි සඳහන් ස්ථානයකට මාරුවීමක් ලබා දීමට උත්සාහ කරන අතර, ඉල්ලා ඇති ස්ථානයකට මාරුවක් ලබා දීමට නොහැකි වුවහොත් වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී නම්,

මාරුවීම් මණ්ඩලයේ අභිමතය පරිදි ද අනෙකුත් අවස්ථාවලදී අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි ද ඔවුන්ට වෙනත් සුදුසු සේවා ස්ථාන ලබා දෙනු ඇත.

04. ප්‍රියමනාප යයි නම් කළ සේවා ස්ථානයක හෝ කාර්යාලයක සේවය කරන නිලධාරියෙකු එවැනිම වෙනත් කාර්යාලයකට මාරු කරනු නොලැබේ. සේවාවන් අනුව ප්‍රියමනාප සේවා ස්ථාන ලෙස හඳුන්වනු ලබන කාර්යාලවල නාම ලේඛණයක් 1 වන උප ලේඛණය මගින් සඳහන් කර ඇත.

4.1 ප්‍රියමනාප ස්ථානයක සේවය කරන නිලධාරියෙකු ප්‍රියමනාප නොවන ස්ථානයකට ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම් නිලධාරියා ප්‍රියමනාප ස්ථානයේ සේවා කාලය සම්පූර්ණ කර නොතිබුණ ද ස්ථාන මාරුවකට සුදුසුකම් ලබති.

05. අමතර දීමනා හෝ දිරිදීමනා ලැබෙන ස්ථානයක සේවය කරන නිලධාරියෙකුට නැවතත් එබඳු ස්ථානයකට ස්ථාන මාරුවීමට ඉඩ දෙනු නොලැබේ.

06. සේවයේ අවශ්‍යතාවයන් මත හා හදිසි අවශ්‍යතා මත නිලධාරියෙකුගේ ඉල්ලීමකින් හෝ කැමැත්තකින් තොරව ස්ථාන මාරු කරනු ලැබීමට පුළුවන.

07. වාර්ෂික ස්ථාන මාරු කිරීම් - 2010

7.1 මෙම චක්‍රලේඛයේ 3.1 ඡේදයේ දැක්වෙන අවශ්‍යතා සපුරාලන නිලධාරින්ට තමන් ස්ථාන මාරුවීමකට යටත් වුවහොත් යැමට වඩාත්ම කැමති කාර්යාල/සේවා ප්‍රදේශ පැහැදිලිව දක්වමින් මේ සමඟ ඇති අංක 01 ආකෘතියට අනුව සකස් කළ ඉල්ලුම්පතක් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත 2009.08.31 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

7.2 එසේ ලැබෙන වාර්ෂික ස්ථාන මාරු කිරීම් සඳහා වූ අයදුම්පත් පහත සඳහන් නිලධාරින්ගෙන් සමන්විත මාරු කිරීමේ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා යොමු කරනු ඇත.

i. අතිරේක අයවැය අධ්‍යක්ෂ ජනරාල්
ii. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නියෝජිතයෙකු
iii. අයවැය සහකාරවරුන්ගේ වෘත්තිය සමිති නියෝජිතයා හෝ අයවැය අධ්‍යක්ෂ ජනරාල් නම් කරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරියෙකු

7.3 වාර්ෂික ස්ථාන මාරු වර්ෂයේ ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක කෙරේ.

7.4 ස්ථාන මාරුවකට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කරන්නේ නම් ස්ථාන මාරුව ක්‍රියාත්මකවීමට යටත් පිරිසෙයින් දින 30 කට පෙරවත් අභියාචනා මණ්ඩලය වෙත සිය අභියාචනා ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

7.5 ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 5 වැනි වගන්තිය අනුව, මාරු මණ්ඩලයක සේවය කළ නිලධාරියෙකු හැරුණු විට අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරින්

දෙදෙනෙකුගෙන් සමන්විත අභියාචනා මණ්ඩලයක් මගින් සිදු කරනු ලැබේ. අභියාචනා මණ්ඩලය විසින් පහත සඳහන් කරුණු පිළිබඳව පරීක්ෂා කර තීරණ ගනු ඇත.

* මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්
* නිලධාරීන්ගේ ඉල්ලීම් ඉටු නොවුණු අවස්ථා
* නිලධාරීන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම්

7.6 මාරු මණ්ඩල මගින් අමාත්‍යාංශයෙන්/දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධාරීන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන, නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වනසේ ඔවුන් මුදා හැරීමට කටයුතු කළ යුතුය. තවද ස්ථාන මාරු නියෝග ලැබූ සියළුම නිලධාරීහු, නියමිත දිනයේ දී නව රාජකාරි ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී සිටිති.

08. ස්ථාන මාරුවීම් සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සියල්ල 2009 අගෝස්තු මස 31 වැනි දිනට පෙර අදාළ ආයතන ප්‍රධානියා මගින් අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

09. මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ඔබගේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ අයවැය සහකාර නිලධාරීන් වෙත දැන ගැනීමට සලස්වා අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වමි.

සුධර්මා කරුණාරත්න
අයවැය අධ්‍යක්ෂ ජනරාල්

Ay

අංක 01 ආකෘතිය

<u>අයවැය සහකාර නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා</u>

<u>ඉල්ලුම්පත්‍රය - 2010</u>

01. i. නිලධාරියාගේ සම්පූර්ණ නම :- ......................................
    ii. නිලධාරියාගේ නම (මුලකුරු සමඟ) :- ..................................
    iii. උපන්දිනය :- .................................................
    iv. ජාතික හැඳුනුම්පත් අංකය :- .......................................
    v. 2009.12.31 දිනට වයස :- ......................................
    vi. ස්ත්‍රී / පුරුෂ භාවය :- ...........................................

02. i. නිලධාරියාගේ ස්ථිර (පෞද්ගලික) ලිපිනය :- .......................... ...
    ...........................................................
    ii. නිලධාරියා දැනට පදිංචි ලිපිනය :- ....................................
    ...........................................................
    iii. දැනට පදිංචි ස්ථානයට ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ................
    iv. පදිංචි දිස්ත්‍රික්කය:- ..............................................

03. i. රාජ්‍ය සේවයට ඇතුළත් වූ දිනය :- ....................................
    ii. අයවැය සහකාර තනතුරට පත් වූ දිනය :- ................................
    iii. 2009.12.31 දිනට අයවැය සහකාර තනතුරේ සේවා කාලය :- ..................

04. i. නිලධාරියා/නිලධාරිණිය විවාහකද/අවිවාහකද යන වග :- ......................
    ii. විවාහක නම් කලත්‍රයාගේ නම :- .....................................
    iii. රැකියාව (තනතුර' :- ............................................
    iv. සේවා ස්ථානය :- ...............................................
    v දරුවන් ගණන :- ..............................................

| දරුවන්ගේ නම් | වයස | ඉගෙනුම ලබන පාසල |
|---|---|---|
| | | |

05. රාජ්‍ය සේවයට ඇතුළත් වූ දිනයේ සිට මේ දක්වා සේවා විස්තර (මෙම ආකෘතිය සම්පූර්ණ කිරීමේ දී ස්ථාන ඉතා වැදගත් වන බව අවධාරණය කෙරේ. මෙහි ඉඩ ප්‍රමාණවත් නොවේ නම් මෙයට අනුරූප ඇමුණුමක් ඇතුළත් කරන්න) :-

| සිට | දක්වා | මුළු කාලය | කාර්ය ස්ථානය (නගරය සඳහන් කරන්න) | දෙපාර්තමේන්තුව | කවර අමාත්‍යාංශයක් යටතේද යනවග |
|---|---|---|---|---|---|
| | | | | | |

06. භාෂා ප්‍රවීණත්වය :-

| සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|
| | | |

07. පරිගණක හැකියාව :- ..................................................

................................................................. .................................................................

08. ස්ථාන මාරුවීමට බලාපොරොත්තු වන සේවා ස්ථාන 05 ක නම් කැමැත්ත අනුපිළිවෙලින් සඳහන් කරන්න.

| සේවා ස්ථානය (දෙපා/අමා) | සේවා ස්ථානයේ ලිපිනය | සේවා ස්ථානය අයත් ප්‍රා.ලේ. කාර්යාලය සහ දිස්ත්‍රික්කය |
|---|---|---|
| | | |

09. ස්ථාන මාරු ඉල්ලීමට හේතු :-

i. ............................................................

ii. ............................................................

iii. ............................................................

10. **ඉල්ලුම්කරුගේ ප්‍රකාශය**

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මාහට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය :- .............  ................

නිලධාරියාගේ අත්සන

11. **ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**

අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත,

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව / රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය / නොහැකිය. ඉල්ලුම් පත්‍රය නිර්දේශ කරනු ලැබේ / නොලැබේ. අදාළ චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කිරීමට එකඟ වෙමි.

දිනය :- ..............  ................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

1 වන උප ලේඛණය

**ප්‍රිය මනාප දෙපාර්තමේන්තු / ආයතන**

1. රේගු දෙපාර්තමේන්තුව
2. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
3. විභාග දෙපාර්තමේන්තුව
4. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
5. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
6. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
7. සුරාබදු දෙපාර්තමේන්තුව
8. ජාතික අයවැය දෙපාර්තමේන්තුව
9. අග්‍රාමාත්‍ය කාර්යාලය
10. ජනාධිපති ලේකම් කාර්යාලය
11. රාජ්‍ය සේවා කොමිෂම